*සැ. යු.*– මෙවර *ගැසට් පත්‍රයේ* V කොටසේ 2001 වර්ෂයේ මුද්‍රිත පොත් නාමාවලියේ ජනවාරි - මාර්තු, කාර්තුව ඉංග්‍රීසි භාෂාවෙන් පළවේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1484 — 2007 පෙබරවාරි මස 09 වැනි සිකුරාදා — 2007.02.09**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු - ඇබෑර්තු … … … … | 90 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … | 92 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 පෙබරවාරි මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 පෙබරවාරි මස 02 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිළධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරිහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිළධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි :

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිළධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලටද යටත් විය යුත්තාහ.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථාද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරින්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරීවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත් වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලිම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබූ යුද්ධ, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවල යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

5. යුද්ධ සේවා අනුග්‍රහය :

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින්ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම්ද ඔවුන් මෙම හමුදාවන්ට බැදී ඇත්තේ 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිළධාරීහු :

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නා වූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවුත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කළින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම :

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90 (1) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකෙරෙනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධි විධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම් කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ටද, ඔහුගේ සහාකාරයින්ටද, අනිකුත් විභාගාපේක්ෂකයින්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාගශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට අමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම්ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරීත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු වනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිතික උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් ජේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලිවීමටද යත්න දැරීම තහනම්ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම් කරුවෙකුට උදව්දීමෙන්ද, වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබාගැනීමෙන්ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයින් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය :

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්ට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිවද පිරිසිදුවද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්නද, තෝරා ගත යුතු අන් ප්‍රශ්නද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන්වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සළකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු - ඇබෑර්තු

## සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

### රාජ්‍ය නැටුම් කණ්ඩායමට ශිල්ප/ශිල්පිනීන් බඳවා ගැනීම

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ රාජ්‍ය නැටුම් කණ්ඩායමේ ශිල්පී/ශිල්පිනී තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයෙහි සඳහන් පරිදි වූ අයදුම්පත්‍ර 2007.02.28 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 08 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස උඩ කෙළවර "රාජ්‍ය නැටුම් කණ්ඩායමට ඉල්ලුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුය. අයදුම්පත් සමඟ මෑතකදී ලබාගත් පෝස්ට් කාඩ් ප්‍රමාණයේ ඡායාරූපයක පිටපතක් හා අදාළ සහතිකවල ඡායා පිටපත් එවිය යුතුය.

මූලික සුදුසුකම්:

1. *අධ්‍යාපන සුදුසුකම්* :

*(අ.)* අ.පො.ස. (උසස්පෙළ) විභාගයෙන් සමත්ව තිබීම. (පැරණි නිර්දේශයෙන් නම් විෂයයන් 04 ම හෝ නව නිර්දේශයෙන් නම් විෂයයන් 03 සමත්ව තිබීම. මෙහිදී නර්තන විෂයට අධි සම්මාන හෝ සම්මානයක් තිබීම අනිවාර්යවේ.)

*හෝ*

*(ආ.)* ජාතික නැටුම් අවසාන විභාගය සමත් වීම හෝ හාත්බණ්ඩේ විද්‍යා පීඨයේ නෘත්‍ය විශාරද විභාගය සමත්වීම.

2. *වෙනත් සුදුසුකම් (ශිල්පීය)* :

*(අ.)* නැටුම් ශිල්පිනීන්ට හෝ ශිල්පීන්ට උඩරට/පහතරට/සබරගමු/භරත හෝ කථක් යන විෂයයන්ගෙන් අවම වශයෙන් (02)ක් පිළිබඳ ප්‍රායෝගික දැනුම තිබීම.

*(ආ.)* උඩරට බෙර/පහතරට බෙර/දවුල්/තම්මැට්ටම/හොරණෑ යනාදී භාණ්ඩවලින් දෙකක් වාදනය කිරීමේ හැකියාව.

*(ඇ.)* ජාතික නැටුම් මධ්‍යම සහතිකය සමඟ සංස්කෘතික දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කලායතනයක අවු. 05 කට වැඩි කාලයක් අධ්‍යාපනය ලබා තිබීම.

*(ඈ.)* සාම්ප්‍රදායික නැටුම් ශිල්පය පිළිබඳ දැනුමක් ලබා තිබීම.

3. *උස* :-අවම වශයෙන් ශිල්පීන් සඳහා අඩි 05 අඟල් 07 ක් ද ශිල්පිනීන් අඩි 05 අඟල් 02ක් ද විය යුතුය.

4. *වයස*:- 2007.02.28 දිනට, පිරිමි අවු.18-25 අතර විය යුතුය. ගැහැණු අවු.18-23 අතර විය යුතුය.

5. *බඳවා ගැනීමේ ක්‍රමය* :

*(අ.)* ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක් මගින් පවත්වනු ලබන වාචික හා ප්‍රායෝගික පරීක්ෂණයකින් පසුව සුදුසුකම්ලත් අයදුම්කරුවන් අතුරින් බඳවාගනු ලැබේ.

*(ආ.)* මෙසේ කොන්ත්‍රාත් පදනම මත බඳවාගන්නා ශිල්පීන්ගේ උපරිම සේවා කාලය වසර 05කට සීමාවේ.

*(ඇ.)* තෝරා ගැනීමෙන් පසු සෑම ශිල්පියෙක්ම/ශිල්පිනියෙක්ම ඇපයකට හෝ ගිවිසුමකට යටත් විය යුතුය.

*(ඈ.)* විනිශ්චය මණ්ඩලයේ තේරීම අවසාන නිගමනය වනු ඇත.

*(ඉ.)* මෙහි සඳහන් නොවන යම් කරුණක් වේනොත් ඒ සම්බන්ධයෙන් පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ඇත.

06. *වැටුප් ක්‍රමය* :-බඳවා ගැනීමෙන් පසු මාසිකව රු. 10,000 උපරිමයකට යටත්ව මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

ඊ. එම්. අභයරත්න,
සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ.

2007 ජනවාරි මස 22 වැනි දින,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

ආදර්ශ ඉල්ලුම් පත්‍රය

*සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව*

*රාජ්‍ය නැටුම් ශිල්පී තනතුර*

01. මුලකුරු සමඟ නම : ———.

02. සම්පූර්ණ නම : ———.

03. ස්ථිර ලිපිනය : ———.

04. පදිංචි දිස්ත්‍රික්කය : ———.

05. උපන් දිනය:

(අ) අවුරුද්ද : ———. මාසය : ———. දිනය : ———.
(ආ) 2007.02.28 දිනට වයස:
අවුරුදු: ———. මාස: ———. දින.: ———.

06. ජාතික හැඳුනුම්පත් අංකය: ———.

07. පුරවැසිභාවය : ———.

08. ස්ත්‍රී/පුරුෂ භාවය : ———.

09. උස ප්‍රමාණය : ———.

10. *මූලික අධ්‍යාපන සුදුසුකම්* :

10.1 අ.පොස. උසස් පෙළ : ———.
10.2 ජාතික නැටුම් අවසාන විභාගය : ———.
10.3 හාත්බණ්ඩේ විද්‍යා පීඨයේ නෘත්‍ය විශාරද විභාගය : ———.

11. 11.1 උඩරට/පහතරට/සබරගමු/භරත හෝ කථක් යන විෂයයන් පිළිබඳ දැනුම : ———.
11.2 උඩරට බෙර/පහතරට බෙර/දවුල්/තම්මැට්ටම/හොරණෑ යනාදී භාණ්ඩ වාදනය කිරීමේ හැකියාව: ———.
11.3 සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කලායතනයක අවුරුදු 05කට වැඩි කාලයක් අධ්‍යාපනය ලබා තිබේද ? : ———. තිබේනම් විස්තර සඳහන් කරන්න : ———.
11.4 සාම්ප්‍රදායික නැටුම් ශිල්පියෙකු නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න. : ———.

12. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට අධිකරණය මගින් දඬුවම් ලබා තිබේද ? : —————.

තිබේ නම් විස්තර සඳහන් කරන්න. : —————.

13. මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත්, සහතික කරමි. මෙහි කිසියම් අසත්‍ය හෝ සාවද්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බව මා තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් එම තනතුරට මා නුසුදුස්සෙකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් රහිතව තනතුරෙන් පහකරනු ලැබීමටත් ඉඩ ඇති බව පිළිගනිමි.

—————.
ඉල්ලුම්කරුගේ අත්සන

දිනය. : —————.

02-302/1

---

## සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

### රාජ්‍ය සංගීත කණ්ඩායමට ශිල්ප/ශිල්පිනීන් බඳවා ගැනීම

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ රාජ්‍ය සංගීත කණ්ඩායමේ ශිල්පී/ශිල්පිනී තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයෙහි සඳහන් පරිදි වූ අයදුම්පත්‍ර 2007.02.28 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 08 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස උඩ කෙළවර "රාජ්‍ය සංගීත කණ්ඩායමට ඉල්ලුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුය. අයදුම්පත් සමඟ මෑතකදී ලබාගත් පෝස්ට් කාඩ් ප්‍රමාණයේ ඡායාරූපයක පිටපතක් හා අදාළ සහතිකවල ඡායා පිටපත් එවිය යුතුය.

මූලික සුදුසුකම් :

1. *අධ්‍යාපන සුදුසුකම්* :

(අ.) අ.පො.ස. (උසස්පෙළ) විභාගයෙන් සමත්ව තිබීම. (පැරණි නිර්දේශයෙන් නම් විෂයයන් 04 ම හෝ නව නිර්දේශයෙන් නම් විෂයයන් 03 එකවර සමත්ව තිබීම. මෙහිදී සංගීත විෂයට අධි සම්මාන හෝ සම්මානයක් තිබීම අනිවාර්යවේ.)

*හෝ*

(ආ.) ජාතික නැටුම්/සංගීත අවසාන විභාගයෙන් සංගීත අවසාන විභාගය සමත් වීම හෝ හාත්බණ්ඩේ විද්‍යා පීඨයේ සංගීත විශාරද විභාගය සමත්වීම.

2. *ශිල්පීය සුදුසුකම්* :

*(අ.)* පහත දැක්වෙන භාණ්ඩවලින් වැඩි ප්‍රමාණයක් වාදනය කිරීමට ඇති හැකියාව. වයලින්/සිතාර්/තබ්ලා/චෙලෝ/වියෝලා/සෙක්සෆෝන්/ගිටාර් (ලීඩ් බේස් රිදම්) ඕගන්/බටනලා දේශීය හා විදේශීය තාල වාද්‍ය භාණ්ඩ.

*(ආ.)* ස්වර ප්‍රස්ථාර කියවීමේ හැකියාව.

*(ඇ.)* බටහිර සංගීත ශිල්ප පිළිබඳ දැනුමක් ලබා තිබීම.

*(ඈ.)* ගායනය සහ වාදනය පිළිබඳ ඇති කුසලතාව අතිරේක සුදුසුකමක් වනු ඇත.

*(ඉ.)* ජාතික නැටුම්/සංගීත විභාගයේ සංගීත මධ්‍යම සහතිකය සමඟ සංස්කෘතික දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කලායතනයක අවුරුදු 05කට වැඩි කාලයක් අධ්‍යාපනය ලබා තිබීම.

3. *වයස් සීමාව*- 2007.02.28 දිනට, අවුරුදු 18-25 අතර විය යුතුය.

4 *බඳවා ගැනීමේ ක්‍රමය* :

*(අ.)* ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක් මගින් පවත්වනු ලබන වාචික හා ප්‍රායෝගික පරීක්ෂණයකින් පසුව සුදුසුකම්ලත් අයදුම්කරුවන් අතුරින් බඳවාගනු ලැබේ.

*(ආ.)* මෙසේ කොන්ත්‍රාත් පදනම මත බඳවාගන්නා ශිල්පීන්ගේ උපරිම සේවා කාලය වසර 05කට සීමාවේ.

*(ඇ.)* තෝරා ගැනීමෙන් පසු සෑම ශිල්පියෙක්ම/ශිල්පිනියෙක්ම ඇපයකට හෝ ගිවිසුමකට යටත් විය යුතුය.

*(ඈ.)* විනිශ්චය මණ්ඩලයේ තේරීම අවසාන නිගමනය වනු ඇත.

*(ඉ.)* මෙහි සඳහන් නොවන යම් කරුණක් වේතොත් ඒ සම්බන්ධයෙන් පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ඇත.

05. *වැටුප් ක්‍රමය* :-බඳවා ගැනීමෙන් පසු මාසිකව රු. 10,000 උපරිමයකට යටත්ව මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

ඊ. එම්. අභයරත්න,
සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ.

2007 ජනවාරි මස 22 වැනි දින,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

*සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව*

*රාජ්‍ය සංගීත ශිල්පී තනතුර*

01. මුලකුරු සමඟ නම : —————.

02. සම්පූර්ණ නම : —————.

03. ස්ථිර ලිපිනය : —————.

04. පදිංචි දිස්ත්‍රික්කය : —————.

05. උපන් දිනය :
(අ) අවුරුද්ද : —————. මාසය : —————. දිනය. : —————.

(ආ) 2007.02.28 දිනට වයස : —————.
අවුරුදු : —————. මාස: —————. දින: —————.

06. ජාතික හැඳුනුම්පත් අංකය: —————.

07. පුරවැසිභාවය : —————.

08. ස්ත්‍රී/පුරුෂ භාවය : —————.

09. *මූලික අධ්‍යාපන සුදුසුකම්:*

9.1 අ.පොස. උසස් පෙළ : ————.

9.2 ජාතික සංගීත අවසාන විභාගය : ————.

9.3 භාත්ඛණ්ඩේ විද්‍යා පීඨයේ සංගීත විශාරද විභාගය : ————.

10. 10.1 වයලීන්/සිතාර්/තබ්ලා/චෙලෝ/වියෝලා/සෙක්සෆෝන්/ගිටාර් (ලීඩ් බේස් රිදම්) ඕගන්/බටනලා දේශීය හා විදේශීය තාල වාද්‍ය භාණ්ඩ වාදනය කිරීමේ හැකියාව : ————.

10.2 ස්වර ප්‍රස්තාර කියවීමේ හැකියාව: ————.

10.3 බටහිර සංගීත ශිල්පය පිළිබඳ දැනුම : ————.

10.4 ගායනය පිළිබඳ ඇති කුසලතාව : ————.

10.5 සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කලායතනයක අවුරුදු 05කට වැඩි කාලයක් අධ්‍යාපනය ලබා තිබේද ? තිබේ නම් විස්තර සඳහන් කරන්න : ————.

11. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට අධිකරණය මගින් දඬුවම් ලබා තිබේද ? : ————.

තිබේ නම් විස්තර සඳහන් කරන්න. : ————.

13. මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත්, සහතික කරමි. මෙහි කිසියම් අසත්‍ය හෝ සාවද්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බව මා තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් එම තනතුරට මා නුසුදුස්සෙකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් රහිතව තනතුරෙන් පහකරනු ලැබීමටත් ඉඩ ඇති බව පිළිගනිමි.

————.
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය : ————.

02-302/2

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශය

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ ගොඩනැගිලි ඕවසියර්/වැඩ පරීක්ෂක තනතුර සඳහා නිලධාරීන් බඳවාගැනීමේ විවෘත තරඟ විභාගය - 2007

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ ගොඩනැගිලි ඕවසියර් /වැඩ පරීක්ෂක තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන විවෘත තරඟ විභාගයක් මගින් බඳවා ගැනීමට අයදුම්පත් මින් කැඳවනු ලැබේ.

02. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2007.03.09 වන අතර එදිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව බල නොපායි.

03. විභාගයට ඉදිරිපත් වන අපේක්ෂක අපේක්ෂිකාවන් පහත සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අවශ්‍යය.

3.1 *අවශ්‍ය සුදුසුකම් :*

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව,

හෝ

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඩිප්ලෝමාව,

හෝ

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණ ඩිප්ලෝමාවක්

හෝ

මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි කාර්මික ආයතනයේ ගොඩනැගිලි නිර්මාණය පිළිබඳව ඩිප්ලෝමා සහතිකය

සහ

භාෂාව හෝ සාහිත්‍ය, අංක ගණිතය/ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (6) අ.පො.ස. (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම හෝ සමාන විභාගයකින් සමත්වීම.

සටහන-ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙන් ඩිප්ලෝමාවක් ලබාගත් අය එම විශ්ව විද්‍යාලයේ එම ඩිප්ලෝමාවට අදාළ පදනම් පාඨමාලාව සමත්වී ඇත්නම් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කළ හැක.

*සැලකිය යුතුයි* - අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසාන දිනය වන විට සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

04. *අයදුම් කළ යුතු ක්‍රමය* -

(අ) මෙම විභාගය සඳහා වූ අයදුම්පත් ආකෘතිය මෙම නිවේදනයේ අවසානයේ පළකර ඇත. ඒ අනුව අයදුම්පත ඒ4 (21cm x 29cm) ප්‍රමාණයේ කඩදාසියක පමණක් දෙපැත්තේම පිළියෙල කළ යුතුවේ. (අයදුම්පතේ 1 සිට 4 දක්වා ඡේද අනිවාර්යයෙන්ම මුල් පිටුවට ඇතුළත් විය යුතුය.)

(ආ) විභාගයට පෙනී සිටින මාධ්‍යයෙන් අයදුම්පත සම්පූර්ණ කළ යුතුවේ.

(ඇ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2007.03.09 දින හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්ත මේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(ඈ) අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ ගොඩනැගිලි ඕවසියර්/වැඩ පරීක්ෂක තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2007" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ඉ) විභාග ගාස්තු වශයෙන් රුපියල් 250ක මුදලක් ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා ලබාගත් මුදල් කුවිතාන්සිය අයදුම්පතේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ලඟ තබා ගන්න.

(ඊ) විභාගය අවලංගු කරනු ලැබුවහොත් මිස විභාග ගාස්තු කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ. තවද මෙම විභාගය සඳහා ගෙවනු ලබන විභාග ගාස්තුව වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමටද නොහැක.

(උ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර තැපෑලේ දී සිදුවන නැතිවීම් හා ප්‍රමාද වීම් ගැන කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

(ඌ) මෙම විභාගයට පෙනී සිටීම පමණක්ම අදාළ තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකමක් නොවනු ඇත.

(එ) රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු හෝ සමාදාන විනිශ්චය කාරවරයෙකු හෝ නීතිඥයකු හෝ රජයේ සේවයේ මාණ්ඩලික තනතුරක් දරන නිලධාරියෙකු විසින් අයදුම්පත්‍රයේ අපේක්ෂක/ අපේක්ෂිකාවගේ අත්සන සහතික කළ යුතුය.

(ඒ) දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් තම ආයතන ප්‍රධානියා මගින් මෙම අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

05. *විභාගයට ඇතුළත්වීම* -

(අ) *ප්‍රවේශ පත්‍ර* - අයදුම්පත්‍ර එවා ඇති අපේක්ෂක/අපේක්ෂිකාවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයෙකු තමාට නියමිත මධ්‍යස්ථානයේදී විභාග ශාලාධිපතිට තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන කිසිදු අයදුම්කරුවෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) විභාග දිනට දින 7කට කලින් ප්‍රවේශ පත්‍ර නොලබන අපේක්ෂක/ අපේක්ෂිකාවන් පහත සඳහන් විස්තර නොපමාව බත්තරමුල්ල පැලවත්ත විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් වෙත දන්වමින් ප්‍රවේශ පත්‍ර ඉල්ලුම් කළ යුතුය.

i. විභාගයේ නම,
ii. අපේක්ෂක/අපේක්ෂිකාවගේ සම්පූර්ණ නම,
iii. ලිපිනය,
iv. ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි කල දිනය, ලියාපදිංචි කල තැපැල් කාර්යාලය හා අංකය,
vi. විභාග ගාස්තු ගෙවූ කුවිතාන්සියේ අංකය, දිනය හා තැපැල් කාර්යාලය.

(ඇ) මෙම විභාගයට පෙනී සිටීම වෙනුවෙන් අපේක්ෂක/අපේක්ෂිකාවන්ට දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

(ඈ) *අනන්‍යතාවය:* තමා පෙනී සිටින සෑම විෂයක් සම්බන්ධයෙන්ම වි භාග පරිපාලක සෑහීමට පත්වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කල යුතුය. මේ සඳහා,

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව නිකුත් කල ජාතික හැඳුනුම්පත, හෝ

ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පිළිගැනේ.

06. *විෂය නිර්දේශය* -

i. බුද්ධි පරීක්ෂණය (කාලය පැය 1යි මුළු ලකුණු 100) අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයත් තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ වාස්තවික ප්‍රශ්නවලින් යුක්තය.
ii. තාක්ෂණ ප්‍රශ්න පත්‍රය (කාලය පැය 2 යි මුළු ලකුණු 100 යි)

i වන කොටසට වාස්තවික ප්‍රශ්න පත්‍රය කාලය පැය 1 යි
ii වන කොටස ව්‍යුහගත රචනා ප්‍රශ්න පත්‍රය පැය 1 යි

(අ) *මැනීම සහ මට්ටම ගැනීම:* දම්වැල් මිනුම්, මට්ටම් ගැනීම, තියෝඩලයිට්ටුව භාවිතය පිළිබඳව හා තල මේස මැනුම් පිළිබඳ දැනුම.

(ආ) *ගොඩනැගිලි ද්‍රව්‍ය:* සිමෙන්ති, හුණු, වැලි, ගල්, තීන්ත වර්ග, ප්ලාස්ටික් සහ වීදුරු ගොඩනැගිලි ද්‍රව්‍ය වශයෙන් යොදා ගනු ලබන ආකාරය, හොඳ තත්ත්වයේ දැව හඳුනාගැනීම පිළිබඳ දැනුම

(ඇ) *ගොඩනැගිලි ඉදිකිරීම සහ ඇස්තමේන්තු පිළියෙල කිරීම:* අත්තිවාරම්, බිත්ති බැඳීම, දැව වහලය, යකට කාප්ප, කුළුණු, කොන්ක්‍රීට් තලාද සහ කොන්ක්‍රීට් කුළුණු/අත්තිවාරම්/තට්ටු තරප්පු පැති බැම් ආදිය යොදනු ලබන ආකාරය සහ යොදනු ලබන අවස්ථා, මිනුම් ලබා ගැනීම, ඇස්තමේන්තු පිළියල කිරීම, ඉදිකිරීම සඳහා අවශ්‍ය වන ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රමාණයන් සහ කම්කරුවන් සංඛ්‍යාව ඇස්ත මේන්තු කිරීම.

(ඈ) ව්‍යුහනම්‍යතා/ව්‍යාකෘතිවල බලසටහන.

(ඉ) *සේවාවන්*-විදුලිය, ජලය, සනීපාරක්ෂක.

ඉහත විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කිරීමට සැකසූ ප්‍රශ්න පත්‍රයකි.

*සටහන.*- එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40% හෝ ඊට වැඩියෙන් ලබාගත් අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණු එකතු කිරීමෙන් සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනය මත බඳවා ගැනීම සඳහා සලකා බලනු ලැබේ.

07. *මාධ්‍යය:* මෙම විභාගය සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයින් විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පෙනී සිටිය යුතුය.

08. *විභාගය පවත්වන ස්ථානය:*

මෙම විභාගය 2007 මැයි මාසයේ දී කොළඹ දී පවත්වනු ලැබේ.

09. *සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

ii. 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/ 2006 අනුව මාසික වැටුප් පරිමාණය රු.14,140-140 x 10- 150 x 11-210 x 6-290 x 14-රු. 22,510 වේ. (ඒ අනුව මෙම වැටුප් පරිමාණයේ තුන්වන වැටුප් පියවරට එලඹීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුය.)

10. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

11. *ගැසට්* නිවේදනයේ සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට තරඟ විභාගයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් ඉඩ දෙනු ලැබේ. තරඟ විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට්* නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අයදුම්පත්‍ර භාර ගන්නා අවසන් දින වන විට අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණකර නොතිබුණ බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

(*සටහන: මෙම ගැසට් නිවේදනයේ* සිංහල දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළවී ඇති නිවේදනවල කිසියම් පරස්පර විරෝධී බවක් ඇත්නම් නිවැරදි ලෙස සලකන්නේ සිංහල භාෂාවෙන් පළ කර ඇති නිවේදනය බව කරුණාවෙන් සලකන්න)

ආචාර්ය සී. කුඩාගමගේ,
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

(කාර්යාල ප්‍රයෝජනය සඳහා)

*ආදර්ශ අයදුම්පත්‍රය*

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ ගොඩනැගිලි ඕවසියර්/වැඩ පරීක්ෂක තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය සඳහා අයදුම්පත - 2007

Application for Open Competitive Examination for Recruitment to the Post of Buildging Overseer/Inspector of works of the Sri Lanka Technological Service in the Department of Agriculture - 2007

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය

| |
|---|
| සිංහල 2 |
| දෙමළ 3 |
| ඉංග්‍රීසි 4 |

අදාල අංකය කොටුව තුළ ලියන්න

01. නම :

1.1 මුලකුරු සමග නම : ———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා - SILVA, A.B.

1.2 සම්පූර්ණ නම : ———.
(සිංහලෙන්/දෙමළෙන්)

1.3 ජාතික හැඳුනුම්පත් අංකය :

02. ස්ථිර ලිපිනය : ———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.1 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය : ———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී 1 පුරුෂ 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.1 උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :

3.2 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස : ———.

අවුරුදු : මාස : දින :

04. විවාහක/අවිවාහක බව :
විවාහක-1, අවිවාහක -2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. අධ්‍යාපන සුදුසුකම් (භාෂා මාධ්‍ය සමග) :

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය/අ.පො.ස. (සා.පෙළ)/ ජා.පො.අ.ස. විභාගය

| | පළමු වතාව | දෙවන වතාව |
|---|---|---|
| විභාගයේ නම : | ...................... | ...................... |
| වර්ෂය හා මාසය : | ...................... | ...................... |
| විභාග අංකය : | ...................... | ...................... |
| භාෂා මාධ්‍යය : | ...................... | ...................... |

| | පළමු වතාව | | දෙවන වතාව | |
|---|---|---|---|---|
| | විෂය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
| 1 | ——— | ——— | ——— | ——— |
| 2 | ——— | ——— | ——— | ——— |
| 3 | ——— | ——— | ——— | ——— |
| 4 | ——— | ——— | ——— | ——— |
| 5 | ——— | ——— | ——— | ——— |
| 6 | ——— | ——— | ——— | ——— |
| 7 | ——— | ——— | ——— | ——— |
| 8 | ——— | ——— | ——— | ——— |
| 9 | ——— | ——— | ——— | ——— |

06. වෘත්තීය සුදුසුකම් :

| ඩිප්ලෝමාව සහ ආයතනයේ නම | සමත්වූ වර්ෂය | විභාග අංකය | සමත් විෂයන් | සාමාර්ථය |
|---|---|---|---|---|
| | | | | |

07. විභාග ගාස්තු ගෙවන ලද තැපැල් කාර්යාලය :

ගෙවන ලද දිනය : ———.
රිසිට්පත් අංකය : ———.

විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සිය නොගැලවෙනසේ මෙහි අලවන්න.

08. අයදුම්කරුගේ සහතිකය :

මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදි වූත් ඒවා බවට මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි ඒවා බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත්, මා නුසුදුස්සෙකු වීමට යටත් වන බවත් පත්කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මම දැන සිටිමි.

මෙම විභාගයේ කොන්දේසි සියල්ල පිළිපැදීමට මම එකඟ වෙමි.

දිනය : ———. ———.
අයදුම්කරුගේ අත්සන.

09. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :
මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන.................... යන අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු/ඇය මා ඉදිරිපිටදී ......................දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

———
අත්සන සහතික කරන ලද නිලධාරියාගේ අත්සන.

දිනය : ———.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : ———.
තනතුර : ———.
ලිපිනය : ———.
(නිලමුද්‍රාවෙන් සනාථ කරන්න)

10. විභාග කොමසාරිස් ජනරාල්,
ඉහත විස්තර දැක්වෙන අපේක්ෂක/අපේක්ෂිකාවන්ට මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් ඇති/නැති බව මම සහතික කරමි.

———.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා පදවි නාමය

දිනය : ———.

02-341

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.